2022

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report



ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
தேசிய நூதனசாலைகள் திணைக்களம்
Department of National Museums

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசன மத மற்றும் கலாச்சார விவகார அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 208

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ 07

(01). ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය:

1.1. හැඳින්වීම:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොට ම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, හම්බන්තොට මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හා පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර ප්‍රදර්ශන සහ දේශන හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර:

(අ). ආයතනයේ දැක්ම:

දැනුම සහ ආස්වාදයෙන් පරිපූර්ණ අර්ථවත් කෞතුකාගාර සේවාවක් මහජනතාව වෙත ලබා දීම.

(ආ). ආයතනයේ මෙහෙවර:

සංස්කෘතික සහ ස්වභාවික උරුමය පිළිබිඹු කෙරෙන කෞතුක භාණ්ඩ සහ නිදර්ශක අත්පත් කරගැනීම, එක්රැස් කිරීම, විධිමත්ව ලේඛණගත කිරීම, විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම සහ එම එකතූන් සහ දැනුම පර්යේෂණ, අධ්‍යයන, අධ්‍යාපන අරමුණු සහ රසාස්වාදය උදෙසා ඵලදායී ලෙසත් ආකර්ශනීය ලෙසත් මහජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම.

1.3. කාර්යභාරය

- පුරාවිද්‍යාව, මානව වංශ විද්‍යාව, මානව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව සහ භූ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කෞතුක භාණ්ඩ සහ නිදර්ශක රැස් කිරීම,ලේඛනගත කිරීම සහ ආරක්ෂා කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කොළඹ ජාතික කෞතුකාගාරය ඇතුළු කෞතුකාගාර එකොළහක ස්ථිර ප්‍රදර්ශන යාවත්කාලීනව පවත්වා ගැනීම, ආරක්ෂාව තහවුරු කිරීම සහ දෛනික නඩත්තු සහ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම.

- සංරක්ෂිත පැරණිතම ග්‍රන්ථ සහ පුස්කොළපොත් චිකතුවක් සහිත ජාතික කෞතුකාගාර පුස්තකාලය මගින් පර්යේෂකයන් සඳහා ඵලදායී විමර්ශන සේවාවක් ලබාදීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශයට පත්කිරීම.
- ස්පෝලියා සෙලනිකා නැමති පර්යේෂණ සංග්‍රහය, කෞතුකාගාර චිකතූන්ට අදාළ පර්යේෂණ සහ නාමාවලි, දෙපාර්තමේන්තු ප්‍රකාශන ලෙස මුද්‍රණය වී තිබෙන විරල ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම.
- උක්ත විෂය ක්ෂෙත්‍රයන්ට අදාළව දැනුම වර්ධනය කිරීම සඳහා දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සහිත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල විද්‍යාර්ථීන් සඳහා කෞතුකාගාර විද්‍යාව පිළිබඳ දැනුම ලබාදීම සඳහා සම්පත් දායක ආයතනය ලෙස කටයුතු කිරීම.
- නීතිමය කටයුතු සඳහා සත්ත්ව ආදර්ශක හඳුනාගැනීමට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.
- බාහිර ආයතන විසින් කෞතුකාගාර ස්ථාපනය කිරීමේදී උපදේශන සේවා ලබාදීම.
- ආකර්ෂණීය කෞතුකාගාර සේවාවක් ලබාදීම තුළින් දෙස් විදෙස් කෞතුකාගාර නරඹන්නන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් ජාතික ආදායමට දායකත්වයක් ලබාදීම.

1.4. සංවිධාන සටහන: (ඇමුණුම: 01 බලන්න)

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

(අ). දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

- මානවවංශ විද්‍යා අංශය
- මානව විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- ජාතික කෞතුකාගාර පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය
- සංරක්ෂණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඡායාරූප අංශය
- ප්‍රදර්ශන සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

(ආ). දෙපාර්තමේන්තුවේ යටතේ පාලනය වන කෞතුකාගාර:

- කොළඹ ජාතික කෞතුකාගාරය
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය - කොළඹ
- මහනුවර ජාතික කෞතුකාගාරය
- රත්නපුර ජාතික කෞතුකාගාරය
- ගාල්ල ජාතික කෞතුකාගාරය
- ඕලන්ද කෞතුකාගාරය - පිටකොටුව
- ජන කෞතුකාගාරය - අනුරාධපුරය
- සමුද්‍ර කෞතුකාගාරය - ගාල්ල
- නිදහස් අනුස්මරණ කෞතුකාගාරය - කොළඹ
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - හම්බන්තොට
- පුරාණ තාක්ෂණ කෞතුකාගාරය - පොළොන්නරුව

(02). ප්‍රගතිය හා ඉදිරි දැක්ම:

ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක:

(අ). ජයග්‍රහණ:

- ශ්‍රී ලංකා ජාතික යුනෙස්කෝ කොමිසමේ සහයෝගය ඇතුව පහත දැක්වෙන දුරුලභ කෞතුකාගාර ප්‍රකාශන හතර නැවත මුද්‍රණය කිරීම
  - (01). Sigiri Graffiti (Vol: II)
  - (02).Gazetteer of the a central Province of Ceylon (Vol. 1)
  - (03). Gazetteer of the a central Province of Ceylon (Vol. 11)
  - (04). Geology of Ceylon
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සඳහා ව්‍යාපාරික සැලැස්මක් සැකසීම:
  ආරම්භයේ සිට මේ දක්වා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ව්‍යාපාරික සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, 2022 වසරේදී එම සැලැස්ම සකස් කරන ලදී. කමිටු 06 ක් යටතේ එය ක්‍රියාත්මක වන අතර, මෙහි මූලික අරමුණ වන්නේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කෞතුකාගාර වඩාත් මහජන ආකර්ෂණය දිනාගන්නා ආයතන බවට පත්කිරීමත්, ජාතික ආර්ථිකයට නව ආදායම් උත්පාදනය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත්ය.

  මෙම ව්‍යාපාරික සැලැස්මේ මූලික කටයුතු 2022 සැප්තැම්බර් මාසයේදී කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රය කේන්ද්‍ර කරගෙන ආරම්භ කළ අතර, ඒ යටතේ පහත දැක්වෙන කාර්යයන් එම පරිශ්‍රය ආශ්‍රිතව සිදුකරන ලදී.

  01. සාහිත්‍ය මාසය වෙනුවෙන් දින 15 ක විශේෂ, කෞතුකාගාර ප්‍රකාශන අලෙවි සැලක් පැවැත්වීම
  02. ලෝක සංඥා භාෂා දින සැමරුම් වැඩසටහන
  03. ලෝක සංචාරක දින සැමරුම් වැඩසටහන
  04. ලෝක ළමාදින සැමරුම් වැඩසටහන
  05. නත්තල් උත්සවය

- උද්භිද විද්‍යා අංශයේ ශාඛාගාරය සකස් කිරීම
- මහනුවර ජාතික කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- 'ශ්‍රී ලංකාවේ මිල මුදල්' ග්‍රන්ථය නැවත මුද්‍රණය කිරීම
- 'ස්පෝලියා සෙලනිකා - 50 වෙළුම' පර්යේෂණ ග්‍රන්ථය, 'කෞතුකාගාර සඟරාව 20 කලාපය' මුද්‍රණයට බාරදීම හා 'ශ්‍රී ලංකාවේ කෝලම් සම්ප්‍රදාය' ග්‍රන්ථය නැවත මුද්‍රණය සඳහා භාරදීම
- 'ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් නෝට්ටු' පිළිබඳ ජංගම ප්‍රදර්ශනය සකස් කිරීම
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වහල අළුත්වැඩියා කිරීම

(ආ). අභියෝග හා ඉදිරි ඉලක්ක:

- ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ගිනි ආරක්ෂණ පද්ධතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සකස් කිරීම
- කොළඹ ජාතික කෞතුකාගාරයේ සිතුවම් මැදිරියේ වහලය අලුත්වැඩියා කිරීම
- ස්පෝලියා සෙලනිකා - 52 වෙළුම' පර්යේෂණ ග්‍රන්ථය හා 'කෞතුකාගාර සඟරාව - 21 කලාපය' මුද්‍රණය කිරීම
- A Guide to National Museum Colombo ග්‍රන්ථය නැවත මුද්‍රණය කිරීම
- ඕලන්ද කෞතුකාගාරයේ මැදිරි නවීකරණය කිරීම
- දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීම

    (01). ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ කලා හා ශිල්ප - ආනන්ද කුමාරස්වාමි

    (02). කෞතුක වස්තු සංරක්ෂණ මූලධර්ම - සිරිනිමල් ලක්දුසිංහ

.....

සනූජා කස්තුරිආරච්චි

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්සිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		279,595,614	356,631,000	එස්සිඒ-3
-	තැන්පතු		5,920,189	9,866,581	එස්සිඒ-4
10,000,000	අත්තිකාරම් ගිණුම්		13,482,909	11,575,427	එස්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
10,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**298,998,713**	**378,073,008**	
10,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**298,998,713**	**378,073,008**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)			-	
10,000,000	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**298,998,713**	**378,073,008**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්			-	
206,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	193,962,005	173,300,780	
66,900,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	61,818,631	46,975,693	එස්සිඒ-2(ii)
1,600,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,482,710	1,341,835	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-		
275,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**257,263,345**	**221,618,308**	
	මූලධන වියදම්				
85,850,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	35,284,788	56,304,017	
71,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	24,183,001	78,328,980	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එස්සිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
600,000	හැකියා වර්ධනය	14	560,665	394,700	
13,850,000	වෙනත් මූලධන වියදම්	15	11,926,078	18,793,402	
172,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**71,954,532**	**153,821,099**	
	තැන්පතු ගෙවීම්		9,442,779	5,922,816	එස්සිඒ-4
25,000,000	අත්තිකාරම් ගෙවීම්		13,274,341	16,556,766	එස්සිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
25,000,000	**ප්‍රධාන ලෙජර් වියදම් (උඑ)**		**22,717,120**	**22,479,582**	
472,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+උඑ)**		**351,934,997**	**397,918,989**	
(462,000,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(52,936,285)	(19,845,981)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(56,461,554)	(19,845,981)	එස්සිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		3,525,270	-	එස්සිඒ-3
			(52,936,285)	(19,845,981)	

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑසිඒ-6	11,366,125,118	10,904,428,828
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසිඒ-5/5(ඒ)	41,605,888	41,814,456
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසිඒ-3	-	-
මුළු වත්කම්		**11,407,731,006**	**10,946,243,284**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		28,230,825	24,916,802
දේපළ පිරියත හා උපකරණ සංචිතය		11,366,125,118	10,904,428,828
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒඑසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒඑසිඒ-4	13,375,063	16,897,654
අග්‍රිම ශේෂය	ඒඑසිඒ-3	-	-
මුළු වගකීම්		**11,407,731,006**	**10,921,326,482**

පිටු අංක ...1... සිට ...51... දක්වා ඒඑසිඒ 1 සිට ඒඑසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...52... සිට ...67... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/02/2023	දිනය : 24.02.2023	දිනය :

සනුජා කස්තුරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කොතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

එන්.එච්.ඩබ්.එස්. ද අල්විස්
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික කොතුකාගාර දෙපාර්තමේන්තුව

සෝමරත්න විදානපතිරණ
දේශමි
මුද්‍රණාලය, ආඥාපිත හා සංස්කාරික කටයුතු අමාත්‍යාංශය
නො. 135, "දෘෂ්ටිය"
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ - 07.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	45,973,210	15,339,316
අග්‍රිම ලැබීම්	279,595,614	356,631,000
අත්තිකාරම් අයකර ගැනීම්	13,311,612	12,271,625
තැන්පතු ලැබීම්	5,920,189	9,866,581
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**344,800,625**	**394,108,522**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	255,521,136	220,234,913
සහනාධාර සහ මාරුකිරීම්	1,482,710	1,341,835
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	23,822,845	2,925,054
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,525,270	-
අත්තිකාරම් ගෙවීම්	13,772,181	17,243,890
තැන්පතු ගෙවීම්	9,442,779	5,922,816
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**307,566,920**	**247,668,509**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**37,233,705**	**146,440,013**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	37,233,705	146,440,013
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**37,233,705**	**146,440,013**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(37,233,705)**	**(146,440,013)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන් :

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20-03-99-00	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	20,000,000	20,000,000	34,616,117	173%
20-02-01-01	ගොඩනැගිලි කුලී	4,224,000	4,224,000	1,783,581	42%
20-02-02-99	ණය පොලිය	1, 500, 000	1,500,000	1,677,624	112%

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	**241,000,000**	**275,000,000**	**257, 129, 589**	**94%**
01. මෙහෙයුම් වැඩසටහන්	50,000,000	55,400,000	52, 216, 916	94%
02. සංවර්ධන වැඩසටහන 02. කෞතුකාගාර අධ්‍යාපනය	51,900,000	58,900,000	56, 114, 234	95%
03. කෞතුකාගාර සේවා	139,100,000	160,700,000	148, 798, 439	93%
ප්‍රාග්ධන	**205,000,000**	**172,000,000**	**71, 954, 532**	**42%**
01. මෙහෙයුම් වැඩසටහන්	14,000,000	14,000,000	10, 478, 179	75%
02. සංවර්ධන වැඩසටහන 02. කෞතුකාගාර අධ්‍යාපනය	73,100,000	65,100,000	17, 800, 273	27%
03. කෞතුකාගාර සේවා	117,900,000	92,900,000	43, 676, 080	47%
එකතුව	**446,000,000**	**447,000,000**	**329, 084, 121**	**74%**

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
01	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් ගෙවීම	2,152,340	20,798,500	19, 869,148	96%

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී හිඟුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	829,686,125.00			
9152	යන්ත්‍රෝපකරණ	113,631,784.67			
9153	ඉඩම්	10,396,368,648.71			
9154	අස්පෘශ්‍ය වත්කම්	-			
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-			
9160	කෙරෙමින් පවතින වැඩ	26,438,559.48			
9180	බදු දෙන ලද වත්කම්	-			

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | CAA/B/NM/135/2022/FA | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date | 2023 මැයි 12 දින

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
12 MAY 2023

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටේක්ත සම්පිණ්ඩන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්.එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත්:- 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එවා ඇත.

2. ලේකම්, බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/NM/135/2022/FA | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2023 මැයි 09 දින

ගණන්දීමේ නිලධාරී,

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 09 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් වල අන්තර්ගත වූ ඉඩම් හා ගොඩනැගිලි පිළිවෙලින් රු.10,002,369,340 ක් සහ රු.800,000,000 ක් ලෙස 2013 වර්ෂයේ සිදු කළ තක්සේරු වාර්තාවක් පදනම් කරගනිමින් ගිණුම්ගත කර තිබුණි. මෙම දේපළ වල පිරිවැය තක්සේරු කර වර්ෂ 09 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, රජයේ මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම් තක්සේරු කිරීම සඳහා වන 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර වන පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු කෞතුකාගාරය සම්බන්ධයෙන් වූ ඉඩම් පවරා ගැනීමේ කටයුතු විගණිත දිනය වන විට අවසන් කර තිබූ නමුත්, ඕලන්ද කෞතුකාගාරය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් තක්සේරුකර තක්සේරු අගය මත ගිණුම්ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. බැරකම් හා බැඳීම් එළඹීම

දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයට අදාළව බැඳීම් හා බැරකම් වලට එළඹීමේදී මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන ඉතිරිකිරීම් ඉක්මවා මුළු එකතු වටිනාකම රු.3,461,712 ක බැරකම් හා බැඳීම් වලට එළඹී තිබුණි.

2.2. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	දෙපාර්තමේන්තුව සතු මෝටර් රථවාහන 05 ක ඉන්ධන දහනය පිළිබඳව 2019 වර්ෂයෙන් පසුව පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

2.4. **අවධිමත් ගණුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31 දින දක්වා වර්ෂ 10 ක කාලසීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2022 නොවැම්බර් 30 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම තක්සේරු වටිනාකම මත රු.109,853,607 ක් විය. 2023 ජනවාරි 01 දින හස්ත කර්මාන්ත මණ්ඩලය අදාළ ගොඩනැගිල්ලෙන් ඉවත් වීම මත එම ගොඩනැගිල්ල මුද්‍රා තබා වසා තිබුණි. කෙසේ වෙතත් තක්සේරු අගය මත හිඟ බදු කුළී අයකර නොගැනීම නිසා දෙපාර්තමේන්තුව වෙත සිදු වූ පාඩුව 2022 දෙසැම්බර් 31 දිනට රු.109,853,607 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් 2022 දෙසැම්බර් මස දක්වාත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ කෞතුකාගාර පද්ධතියම නියාමනය කිරීමේ අධිකාරී බලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පවත්නා නීතියට අදාළ සංශෝධනයන් කර කෞතුකාගාර ක්ෂේත්‍රයේ නියාමන බලය ලැබිය යුතු ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත එම බලය ලබා ගැනීමට ක්‍රියා කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් පහත සඳහන් පිළිතුර ලබාදී තිබුණි.

"තමන්ගේ අභිමතය පරිදි කෞතුක භාණ්ඩ එකතූන් සම්බන්ධයෙන් කෞතුකාගාරයක් පවත්වාගෙන යාම සඳහා පුද්ගලයෙකුට හෝ ආයතනයකට කිසිඳු නෛතික බාධාවක් නොමැත. එවැනි කෞතුකාගාර නියාමනය කිරීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ප්‍රායෝගිකව සිදු කළ හැක්කක් නොවේ." එහෙත් අදාළ කෞතුක භාණ්ඩ එකතූන් ලබාගත් මූලාශ්‍රයන් පිළිබඳව හෙළිදරව් කිරීමට බැඳී සිටින සේ නියාමනයක් කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

3.1.2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය වෙනුවෙන් ගිණි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු.98,550,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ මෙම ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර, 2022 මාර්තු 31 දින එහි වැඩ අවසන් කිරීමට නියමිතව පැවතිණි. නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි සමස්ථ භෞතික කාර්යසාධනය සියයට 35 ක් වූ අතර, එදිනට මූල්‍ය වියදම රු.28,579,655 ක් විය. 2023 අප්‍රේල් 04 දින දක්වා මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

3.2. ප්‍රසම්පාදනයන්

රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබාදුන් මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අංක PED/e-GP/Circular/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති චක්‍රලේඛයට සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක PED/e-GP/Circular/2018 හා 2018 ඔක්තෝම්බර් 23 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.3. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරය දිගුකාලයක සිට දෛනිකව භාවිතයට නොගැනීම හේතුවෙන් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ජෛව විද්‍යා මැදිරියට යාබඳව පවතින දෙවන මහලේ වම් පස කොටස මුළුමනින්ම වසා දමා ඇති අතර, 2012 වසරේ සිටම මෙම කොටස මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කර තිබුණි. මෙම කොටස සඳහා සුදුසු අළුත්වැඩියාවන් සිදු කර මහජන ප්‍රදර්ශනය සඳහා කඩිනමින් විවෘත කිරීමේ හෝ ඵලදායී කාර්යයකට මෙම නිශ්කාර්ය කොටස භාවිතා කිරීමේ අවශ්‍යතාවක් පැවතුණි.

3.4. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 මාර්තු 07 දින ජීවිතක්ෂයට පත් වූ නැඳුන්ගමුවේ විජය රාජා හස්තියාගේ සිරුර සංරක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කටයුතු ආරම්භ කර තිබුණි. වර්මය සැකසීමේ මූලික කාර්යයන් සඳහා ශ්‍රී දළදා මාළිගාව විසින් රු.375,530 ක්ද, දෙපාර්තමේන්තුව විසින් රු.284,833 ක්ද වැය කර තිබූ අතර, මේ සම්බන්ධයෙන් වන දෙපාර්තමේන්තු වියදම් සඳහා ශ්‍රී දළදා මාළිගාව විසින් රු.1,182,453 ක මුදලක් ලබාදී තිබුණි. 2022 මාර්තු 16 දින හස්තියාගේ මෘත දේහයෙන් ඉවත් කළ වර්මය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අධිශීතකරණයක තැන්පත් කර තිබීම හා ඉදිරි සංරක්ෂණ කටයුතු සඳහා හස්තියා තිර කිරීමට සුදුසු ස්ථානයක් කඩිනමින් තෝරා නොගැනීම මත සංරක්ෂණ කටයුතු නිසි පරිදි ඉටුකිරීම ප්‍රමාද වී තිබූ අතර, හස්ති වර්මයේ ගුණාත්මකභාවය කෙරෙහිද අවධානමක් පැවතිණි.

(ආ) දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා අංශයේ මැණික් ගල් 272 ක් ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ 1964 සැප්තැම්බර් 18 දින සිට පැවති අතර, 1993 වර්ෂයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී එයින් එක් මැණික් ගලක් කෘතිම ගලක් ලෙසට අනාවරණය වීමෙන් පසුව එම ගල භූ විද්‍යා අංශයේ තැන්පත් කර පැවතුණි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්න විද්‍යාඥයෙකුගේ සහාය ලබාගෙන මෙම ඉතිරි මැණික් ගල් 271 ක ප්‍රමාණයේ වර්තමාන මූල්‍ය වටිනාකම තක්සේරු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වුවත්, තත්‍ය කාර්ය මණ්ඩලය 361 ක් වීම නිසා එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 203 ක් විය. මෙම පුරප්පාඩු වලින් විධායක මට්ටමේ තනතුරු 16 න් තනතුරු 06 ක් සහ කෘතිසික මට්ටමේ තනතුරු 05 න් 04 ක් පුරප්පාඩු වී පැවති අතර, ද්විතියික මට්ටමේ තනතුරු 103 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 90 ක්ද පුරප්පාඩු වී පැවතුණි. මෙම සේවක ඌනතාවය සමාලෝචිත වර්ෂය තුළදීද සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) පුරප්පාඩු තුළ ඇතුළත් MN – 4 ශ්‍රේණියේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වූ අතර, එය වසර 10 කට වඩා කාලයක සිට පුරප්පාඩුවී පවතින, ඉතා වගකීම් සහගත කාර්යභාරයක් ඉටු කළ යුතු මෙම තනතුර සම්පූර්ණ කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලිඛිත අවසර ඉල්ලා සිටියද, අවසර නොලැබීම නිසා එම තනතුර තවදුරටත් පුරප්පාඩු වී පැවතුණි.

(ඇ) ජාතික කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ පිළිබඳ මහජන අවබෝධය ලබාදීම සඳහා ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් නොමැති වීම හා කීට විද්‍යා අංශය, සත්ත්ව විද්‍යා අංශය, උද්භිද විද්‍යා අංශය සහ භූ විද්‍යා අංශය වැනි ස්වභාවික විද්‍යා අංශ වල පවතින පර්යේෂණ සඳහා යොදා ගනු ලබන කෞතුක භාණ්ඩ එකතුව නඩත්තු කිරීම, ලේඛනගත කිරීම, ගබඩා කිරීම සහ නව අයිතම රැස් කිරීම වැනි කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක පරිසක් යොදවා නොතිබීම මත එම අංශ වල කාර්යක්ෂමතාවය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

එච්.එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

(04). කාර්ය සාධන දර්ශක:

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව):

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% -74%
කෞතුක භාණ්ඩ සහ නිදර්ශක සංරක්ෂණ කටයුතු	100%		
අත්කර ගැනීම් හා ලේඛනගත කිරීම්	100%		
යාවත්කාලීන කිරීම්	100%		
නිදර්ශක සංගණනය			27.80%

(05). තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය:

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75% - 100%
16. සෑම මට්ටමකම අදාළ ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතනයක් ගොඩනැගීම. (SGD 16)	16.1 අද්විතීය භාණ්ඩ වකතුවක් සඳහා කෞතුක භාණ්ඩ නිදර්ශක වකතූන් ශක්තිමත් කිරීම.	<u>මානව වංශ විද්‍යා අංශය</u> ❖ අත්පත් කරගත් භාණ්ඩ ප්‍රමාණය • A Knife with Sheath - 2022.03.04 • Three Ola Leaves Manuscripts - 2022.04.29 <u>සත්ත්ව විද්‍යා අංශය</u> ❖ නැඳුන්ගමුව විජය රාජා හස්තියාගේ සිරුර සංරක්ෂණ කාර්ය සඳහා ලබාගැනීම ❖ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 09207/20(B3587/20) දරණ නඩුවට අදාල නඩු භාණ්ඩ අත්පත් කර ගැනීම (වාලම්පූරි දෙකක්) ❖ Marine Sponge Microscopi Slides 2022.01.01 NH – 2022.01.35 NH			100% 100% 100% 100% 100%

		❖ Python Molurus 2022.02.01 NH ❖ Lycodon Striotus Sinhaleyus 2022.03.01 NH **<u>උද්භිද විද්‍යා අංශය</u>** ❖ රත්නපුර ජාතික කෞතුකාගාර උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද නිදර්ශක 57ක් **<u>භූ විද්‍යා අංශය</u>** ❖ භූ විද්‍යා අංශය සතු ආදර්ශක එකතූන් පහත පරිදි වර්ගීකරණය කිරීම හා ආදර්ශක සඳහා වූ ලියාපදිංචි අංක වල පවතින ගැටලු සහගත තත්ත්වයන් හේතුවෙන් නව ආංශික ලියාපදිංචි අංකන ක්‍රමවේදයක් සැකසීම. 1. මැණික් එකතුව 2. ඛණිජ එකතුව • අනගි ඛණිජ එකතුව • සාමාන්‍ය ඛණිජ එකතුව 3. පාෂාණ එකතුව 4. පොසිල එකතුව • ප්‍රුරාසික පොසිල එකතුව • මයෝසීන පොසිල එකතුව • ප්ලයිස්ටෝසීන පොසිල එකතුව • හොලෝසීන පොසිල එකතුව • විදේශීය පොසිල එකතුව 5. ප්‍රාග්වෛතිහාසික අවශේෂ එකතුව ❖ භූ විද්‍යා අංශය සතු ප්ලයිස්ටෝසීන ෆොසිල එකතුවට අදාල වන සත්ත්ව කාණ්ඩ 06කට අයත් ආදර්ශක 305ක සංරක්ෂණ කටයුතු සිදුකිරීම. ❖ ප්ලයිස්ටෝසීන ෆොසිල එකතුවට අයත් ආදර්ශක වල තොරතුරු යාවත්කාලීන කිරීම.			100% 100% 100% 100%

		<u>කොළඹ ජාතික කෞතුකාගාරය</u> ❖ ඇත් දළින් නිමවූ ශාන්තුවරුන්ගේ මූර්ති 4ක් හා කන්‍යා රූප 2 ක් මහනුවර යුග මැදිරියෙහි ප්‍රදර්ශනය සඳහා සැකසීම			76%
	16.2 අභ්‍යන්තර තත්ත්වයන්ට අනුව සංරක්ෂිත කෞතුක භාණ්ඩ/නිදර්ශක චිකතූන් පවත්වාගෙන යාම.	**<u>මානව විද්‍යා අංශය</u>** ❖ මානව විද්‍යා අංශයට අයත් කෞතුක භාණ්ඩ 28ක් සංරක්ෂණය කරවීම **<u>උද්භිද විද්‍යා අංශය</u>** ❖ ත්නපුර ජාතික කෞතුකාගාර උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද නිදර්ශක 57ක වියළි සංරක්ෂිත ශාකාගාර පත්‍රිකා සකස් කිරීම **<u>සත්ත්ව විද්‍යා අංශය</u>** ❖ ක්ෂීරපායී සත්ත්ව චිකතුවෙහි නව විද්‍යාත්මක නාමයන් යාවත්කාලීන කිරීම (සත්ත්ව නිදර්ශක 1378) ❖ නැඳුන්ගමුව විජය රාජා හස්තියාගේ සම සංරක්ෂණය කිරීම ❖ නැඳුන්ගමුව රාජා හස්තියාගේ හිස්කබල හා දළ දෙකෙහි මාංශ කොටස් ඉවත් කොට සංරක්ෂණය කිරීම ❖ මුහුදු බෙල්ලන්ගේ කවඩ චිකතුව සංරක්ෂණය කිරීම ❖ Holo Type, Para Type චිකතුව යාවත්කාලීන කොට සංරක්ෂණය කිරීම **<u>භූවිද්‍යා අංශය</u>** ❖ භූ විද්‍යා අංශය සතු ප්ලයිස්ටෝසීන ෆොසිල චිකතුවට අදාල වන සත්ත්ව කාණ්ඩ 06කට අයත් ආදර්ශක 305ක සංරක්ෂණ කටයුතු සිදුකිරීම. ❖ ප්ලයිස්ටෝසීන ෆොසිල චිකතුවට අයත් ආදර්ශක වල තොරතුරු යාවත්කාලීන කිරීම.		70%	100% 100% 100% 100% 100% 100% 100% 100%

